# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

## කැලණිය විශ්වවිද්‍යාලය

## <u>පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ලියාපදිංචි කිරීම</u>

## <u>2022 අධ්‍යයන වර්ෂය</u>

මෙම ආයතනය මගින් පහත දැක්වෙන පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 2022 ජනවාරි 15 දින තෙක් අයදුම්පත් භාරගනු ලැබේ. මෙම පාඨමාලා 2022 පෙබරවාරි මස ආරම්භ වීමට නියමිත අතර සිංහල මාධ්‍ය දේශන සතිඅන්ත දිනවලද ඉංග්‍රීසි මාධ්‍ය දේශන සතියේ දිනවලද පැවැත්වේ. දේශන මාර්ගගත (Online) තාක්ෂණය ඔස්සේ සහ ආයතන පරිශ්‍රයේදී ද පැවැත්වේ.

### 01. <u>බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (වර්ෂ එකයි)</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම හෝ

II. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම හෝ

III. විද්‍යෝදය හෝ විද්‍යාලංකාර පිරිවෙන්වල අවසාන පරීක්ෂණය සමත්වීම හෝ

IV. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම

පාඨමාලා ගාස්තු : රු. 18,000.00*

### 02. <u>බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලාව - පූර්ණ කාලීන (වර්ෂ එකයි)/අර්ධ කාලීන (වර්ෂ දෙකයි)</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම හෝ

II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් බෞද්ධ අධ්‍යයනය / පාලි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ

III. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම හෝ

IV. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සමත් වීම හෝ

V. විද්‍යෝදය හෝ විද්‍යාලංකාර පිරිවෙන්වල අවසාන පරීක්ෂණය සමත්වීම හෝ

VI. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම

පාඨමාලා ගාස්තු : රු. 20,000.00 *

## 03. **බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලාව - (පර්යේෂණ නිබන්ධයක් සහිත) - පූර්ණ කාලීන (වර්ෂ දෙකයි)**

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම හෝ

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් බෞද්ධ අධ්‍යයනය / පාලි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ

iii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම හෝ

iv. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයේ බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සමත් වීම හෝ

v. ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම

පාඨමාලා ගාස්තු : රු. 20,000.00 *( පළමු වර්ෂය)

පාඨමාලා ගාස්තු : රු. 25,000.00 *( දෙවන වර්ෂය)

## 04. **පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයන සඳහා චීන භාෂා සහතිකපත්‍ර පාඨමාලාව (වර්ෂ එකයි)**

චීන භාෂාව පිළිබඳ පූර්ව දැනුමක් අවශ්‍ය නොවේ.

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

II. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්වීම හෝ

III. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 25,000.00 *

## 05. **පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතිකපත්‍ර පාඨමාලාව (මාස 06)**

පාලි භාෂාව පිළිබඳ පූර්ව දැනුමක් අවශ්‍ය නොවේ.

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

III. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 15,000.00 *

## 06. පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (වර්ෂ එකයි)

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ප්‍රථම උපාධියට අමතරව පහත සඳහන් සුදුසුකම් වලින් එකක්වත් සම්පූර්ණ කොට තිබිය යුතුය.

I. ශ්‍රී ලංකා ප්‍රචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාරම්භ විභාගය සමත් වීම හෝ අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී පාලි විෂය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ
II. බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙහි පාලි භාෂාවට සමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ
III. මෙම ආයතනය විසින් පවත්වන පශ්චාත් උපාධි බෞද්ධ අධ්‍යයනය සඳහා පාලි සහතික පත්‍රය ලබා තිබීම හෝ
IV. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 18,000.00 *

## 07. පාලි අධ්‍යයන ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලාව (වර්ෂ එකයි)

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පාලි විෂයයෙන් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සමත්වීම හෝ
II. පාලි අනුවිෂය ලෙස හදාරා විශේෂ උපාධියක් සමත්වීම හෝ පාලි විෂය සහිතව සාමාන්‍ය උපාධියක් සමත්වීම හෝ
III. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්වීම හෝ
IV. විද්‍යෝදය හෝ විද්‍යාලංකාර පිරිවෙන්වල අවසාන පරීක්ෂණය සමත්වීම හෝ
V. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් පවත්වනු ලබන පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ
VI. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 20,000.00*

## 08. පාලි අධ්‍යයන ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලාව - (පර්යේෂණ නිබන්ධයක් සහිත) - පූර්ණ කාලීන (වර්ෂ දෙකයි)

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පාලි විෂයයෙන් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය සමත්වීම හෝ
II. පාලි අනුවිෂය ලෙස හදාරා විශේෂ උපාධියක් සමත්වීම හෝ පාලි විෂය සහිතව සාමාන්‍ය උපාධියක් සමත්වීම හෝ
III. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්වීම හෝ
IV. විද්‍යෝදය හෝ විද්‍යාලංකාර පිරිවෙන්වල අවසාන පරීක්ෂණය සමත්වීම හෝ
V. පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් පවත්වනු ලබන පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ
VI. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 20,000.00 *( පළමු වර්ෂය)

පාඨමාලා ගාස්තු : රු. 25,000.00 *(දෙවන වර්ෂය)

## 09. <u>**බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (වර්ෂ එකයි )**</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

II. "ආයුර්වේද ශාස්ත්‍රී" ඩිප්ලෝමාව සමත්වීම හා වසර පහකට නොඅඩු ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා තිබීම හෝ

III. ශ්‍රී ලංකා පොලිස් සේවයේ වසර 10 ක අවම නොකැළැල් සේවා කාලයක් සපුරණ ලද සේවය ස්ථිර කර ඇති උප පොලිස් පරීක්ෂක ශ්‍රේණිය හෝ ඉන් ඉහළ ශ්‍රේණියේ නිලධරයෙකු වීම හෝ

IV. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 50,000.00 *

## 10. <u>**බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති (MA) උපාධි පාඨමාලාව (වර්ෂ එකයි )**</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. මෙම ආයතනය මගින් පවත්වන බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය සමත්වීම හෝ

II. ආයුර්වේද වෛද්‍ය උපාධිය ලබා තිබීම හෝ

III. බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සංස්කෘත යන විෂයයකින් ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් හෝ යටත් පිරිසෙයින් එකී විෂයයන් අතුරින් එක් විෂයයක් ඇතුළත් වන සේ ලබාගත් ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධියක් සමග උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ රජය පිළිගත් උපදේශන සහතික පත්‍ර පාඨමාලාවක් සමත්වීම හෝ

IV. මනෝ විද්‍යාව, උපදේශනය, දර්ශනය හෝ සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ

V. පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෙනත් ඕනෑම උපාධියක් සමඟ විශ්වවිද්‍යාලය සහ රජය පිළිගත් ආයතනයක වර්ෂ 03ක අඛණ්ඩ උපදේශන වෘත්තීය පළපුරුද්ද හෝ

VI. ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා ගාස්තු : රු. 75,000.00 *

** පාඨමාලා ගාස්තු වාරික 03 කින් ගෙවිය හැකි අතර ඊට අතිරේකව පාඨමාලා සඳහා ලියාපදිංචි ගාස්තුව රු.1500.00 ක් ද, පුස්තකාල ගාස්තුව රු.1000.00 ක් ද, ආපසු ගෙවනු ලබන පුස්තකාල තැන්පතුව රු.2500.00 ක් සහ විභාග ගාස්තුව රු.2500.00 ක් ද, ගෙවිය යුතු වේ.*

***උක්ත ඉගැන්වීම් පාඨමාලා සඳහා උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අනියම් ශිෂ්‍යයකු ලෙස සහභාගි වියහැකි අතර එහි දී පරීක්ෂණ සඳහා පෙනී සිටීම අවශ්‍ය නොවේ.***

- ***කොන්දේසි සහිතයි.***

**පර්යේෂණ උපාධි (වර්ෂය පුරා ඉල්ලුම්පත් භාරගනු ලැබේ)**

## 11. <u>බෞද්ධ අධ්‍යයන දර්ශනපති (MPhil) උපාධිය (වර්ෂ දෙකයි)</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ශිෂ්ටාචාරය, භාරතීය දර්ශනය, දර්ශනය, සමය අධ්‍යයනය, සිංහල, පුරාවිද්‍යාව, ඉතිහාසය, මනෝවිද්‍යාව, පාලි, සංස්කෘත, සම්භාව්‍ය චීන භාෂාව, සම්භාව්‍ය තිබ්බතීය භාෂාව හෝ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වෙනත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක විශේෂ ශාස්ත්‍රවේදී හෝ සාමාන්‍ය ශාස්ත්‍රවේදී හෝ ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයෙන් ප්‍රථම හෝ ද්විතීය (ඉහළ) පෙළ ශ්‍රේණියක් ලබා සමත්වීම හෝ

II. පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් විෂයයකින් පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයෙන් සමත් වීම හෝ

III. බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව සමත්වීම (ආයතනය විසින් පනවා ඇති කොන්දේසි අනුගමනය කිරීමට යටත්ව) හෝ

IV. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

පාඨමාලා ගාස්තු : රු. 32,000.00 (එක් වර්ෂයකට)**

## 12. <u>බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (PhD) උපාධිය (වර්ෂ තුනයි)</u>

**ඇතුළත් වීමේ අවම සුදුසුකම් :**

I. බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, භාරතීය දර්ශනය, දර්ශනය, සමය අධ්‍යයනය, සිංහල, පුරාවිද්‍යාව, ඉතිහාසය, මනෝවිද්‍යාව, පාලි, සංස්කෘත, සම්භාව්‍ය චීන, සම්භාව්‍ය තිබ්බත හෝ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වෙනත් විෂයයකින් පර්යේෂණ නිබන්ධයන් සහිත දෑ අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාවක් හෝ දර්ශනපති උපාධිය සමත්වීම හෝ

II. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමාන යැයි ආයතනයේ පීඨ සභාව හා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

පාඨමාලා ගාස්තු : රු. 42,000.00 (එක් වර්ෂයකට)**

*** පාඨමාලා ගාස්තු වාරික 03 කින් ගෙවිය හැකි අතර ඊට අතිරේකව පාඨමාලා සඳහා ලියාපදිංචි ගාස්තුව රු.1500.00 ක් ද, පුස්තකාල ගාස්තුව රු.1000.00 ක් ද, ආපසු ගෙවනු ලබන පුස්තකාල තැන්පතුව රු.5000.00 ක් සහ විභාග ගාස්තුව රු.5000.00 ක් ද, ගෙවිය යුතු වේ.*

අයදුම්පත් ආයතන කාර්යාලයෙන් සහ වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර පශ්චාත් උපාධි සහතිකපත්‍ර, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා අයදුම්පත් සඳහා රුපියල් 500.00 ක් ද දර්ශනපති හා දර්ශන විශාරද උපාධි පාඨමාලා සඳහා රුපියල් 1000.00 ක් ද අයකරනු ලැබේ. අයදුම්පත් තැපැල් මගින් ලබාගන්නේ නම් මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086-100181189664 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ගිණුමට, අදාළ මුදල බැර කර අදාළ බැරපත හා ලිපිනය ලියූ (9" x 4" ප්‍රමාණයේ) මුද්දර කවරයක් සමග ආයතනය වෙත යොමු කළ යුතුයි. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් ද, අදාළ අයදුම්පත් ගාස්තුව ඉහත සඳහන් ගිණුමට බැර කර එම බැර පත සමග යොමු කළ යුතුය.

පර්යේෂණ උපාධි සඳහා වන ඉල්ලුම්පත් පෞද්ගලිකව පැමිණ භාරදිය යුතුය.

**මාර්ගගත (Online) තාක්ෂණය ඔස්සේ අයදුම් කිරීම - pgipbs.lk/apply**

**අයදුම්පත් ලබාගැනීම හා නැවත යොමුකිරීම**


ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

113, දුටුගැමුණු වීදිය

කොහුවල

දුරකථනය : 0113051085/ 0112809321 /0112809322

වෙබ් අඩවිය : http://www.pgipbs.kln.ac.lk

e-mail – applicationspgipbs22@gmail.com



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය මැදවච්චියේ ධම්මජෝති හිමි**

අධ්‍යක්ෂ